තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව ඉදිරිපිට දී ය

# චාමර සම්පත් එ. ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව

RTIC Appeal (ලේඛනගත ක්‍රියාපටිපාටිය /පුද්ගලික වශයෙන් විභාග කිරීම)/719/2018 (2019.02.12, 2019.05.21, 2019.06.25, 2019.09.10, 2019.10.08, 2019.10.22, 2019.11.05, 2019.12.03 සහ 2020.01.14 දින පැවති විධිමත් කොමිෂන්සභා රැස්වීමේදී විභාග කිරීමෙන් අනතුරුව 2020.12.15 අනුමත කරන ලද නියෝගය).

2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 32(1) වගන්තිය ප්‍රකාරව කරන ලද නියෝගය

**සභාපති:** මහින්ද ගම්මම්පිල
**කොමිෂන් සභා සමාජික:** ජොෂ්ඨ නීතිඥ කිෂාලි පින්ටෝ ජයවර්ධන
**කොමිෂන් සභා සමාජික:** ජොෂ්ඨ නීතිඥ එස්. ජී. පුංචිහේවා
**කොමිෂන් සභා සමාජික:** විනිසුරු රෝහිණී වල්ගම

**අධ්‍යක්ෂ-ජනරාල්:** ඩී. ජී. එම්. වී. හපුආරච්චි

**අභියාචක** - චාමර සම්පත්
**නොතිසි ලත් පාර්ශවය** - නම්කළ නිලධාරී, ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව

**පෙනීසිටීම**
අභියාචක - චාමර සම්පත්, මාධ්‍යවේදී
තරිඳු ජයවර්ධන, මාධ්‍යවේදී
පොදු අධිකාරිය - ටිකිරි කේ. ජයතිලක, සහකාර මහ ලේකම්
පී. කේ. ඩී. එස්. ඩබ්ලිව්. විජේගුණවර්ධන, නියෝජ්‍ය ප්‍රධාන නිලධාරී

| | |
|---|---|
| තොරතුරු ඉල්ලීම ගොනු කරන ලද දිනය | 2018.06.21 |
| තොරතුරු නිළධරයා තීරණය ලබා දුන් දිනය | 2018.08.21 |
| නම් කල නිළධරයා වෙත අභියාචනය යොමු කළ දිනය | 2018.08.30 |
| නම් කල නිළධරයා තීරණය ලබා දුන් දිනය | 2018.09.07 |
| තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව වෙත අභියාචනය යොමුකළ දිනය | 2018.09.11 |

**අවසාන නියෝගය 2021 පෙබරවාරි 2 වන දින නිකුත් කරන ලදී.**

**අභියාචනයට පසුබිම් වූ කරුණු:**

අභියාචක 2018.06.21 දිනැති තොරතුරු ඉල්ලීම මගින් පහත තොරතුරු ඉල්ලා සිටින ලදී.

1. 2018 වර්ෂයේ තම වත්කම් සහ බැරකම් ප්‍රකාශයන් ඉදිරිපත් කළ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ නාම ලේඛනය.

2. 2010 වර්ෂයේ සිට මේ වන තෙක් වත්කම් සහ බැරකම් ප්‍රකාශනයන් ඉදිරිපත් කළ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ නාම ලෙඛනය.

තොරතුරු නිලධාරියා 2018.08.21 දිනැතිව පිළිතුරු සපයමින් පවසා සිටියේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ වත්කම් සහ බැරකම් ප්‍රකාශනයන් සම්බන්ධ තොරතුරු ලබා ගැනීමට අවශ්‍ය වේ නම් 1975 අංක 01 දරණ වත්කම් සහ බැරකම් ප්‍රකාශ කිරීමේ නීතිය ප්‍රකාරව පාර්ලිමේන්තු කථානායකවරයාට මේ පිළිබඳව ඉල්ලීමක් කළ යුතු බවයි. අභියාචක ඉල්ලා සිටින්නේ වත්කම් සහ බැරකම් ප්‍රකාශනයන් ඉදිරිපත් කළ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ නම් ලැයිස්තුවක් මිසක වත්කම් සහ බැරකම් ප්‍රකාශනයන්හි අන්තර්ගතය නොවන හේතුවෙන් තොරතුරු නිලධාරියාගේ මෙම ප්‍රතිචාරයෙන් අතෘප්තියට පත් අභියාචක 2018.08.30 දිනැතිව නම් කළ නිලධරයා වෙත අභියාචනයක් යොමු කරන ලදී. නම් කළ නිලධරයා 2018.09.07 දිනැතිව ප්‍රතිචාර දක්වමින් ඉදිරිපත් කලේ,

(අ) 1975 අංක 01 දරණ වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීමේ නීතිය ප්‍රකාරව ප්‍රකාශිත සීමිත අවස්ථා හැරුණු විට, අනෙක් සියලුම අවස්ථාවන්හිදී වත්කම් හා වගකීම් ප්‍රකාශනයන්හි රහස්‍යභාවය ආරක්ෂා කළ යුතුය.

(ආ) පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ වත්කම් හා බැරකම් ප්‍රකාශනයන්ට අදාළව අධිකාරිය ඇත්තේ කථානායකවරයාට බවත්, ඒ හා සම්බන්ධ ඕනෑම විමසුමක් කථානායක වෙත යොමු කළ යුතුය.

ඇ) 1975 අංක 01 දරණ වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීමේ නීතියේ 11 වන වගන්තිය ප්‍රකාරව, මෙම පනත වෙනත් පනතක් සමග ගැටීමක් ඇති වූ විට, 1975 අංක 01 දරණ වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීමේ නීතිය බලපැවැත්වෙන බවය.

මෙම තීරණයෙන්ද අභියාචක සෑහීමකට පත් නොවූ හෙයින් 2018.09.11 දිනැතිව අභියාචක කොමිෂන් සභාව වෙත අභියාචනයක් යොමු කරන ලදී.

## නිගමනය

ප්‍රධාන නියෝගයෙන් පිළිබිඹු වන පරිදි මෙම අභියාචනයේ නෛතික හා සිද්ධිමය ප්‍රශ්න සහ කොමිෂන් සභාවේ නිර්ණයන් නැවත සලකා බැලීමේදී, එහි සාරාංශය පහත පරිදි වේ;

*පොදුවේ එකග වන කරුණු*

1. 1975 අංක 01 දරණ වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීමේ නීතියේ 4 (ආ) වගන්තිය ප්‍රකාරව පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් විසින් වත්කම් හා බැරකම් ප්‍රකාශ පාර්ලිමේන්තු කථානායකවරයා වෙත ඉදිරිපත් කරන බවට මෙම අභියාචනයේ දෙපාර්ශවයේම පොදු එකඟතාවය විය.

2. අදාළ පාර්ලිමේන්තු ස්ථාවර නියෝග මගින් දරනු ලබන පරිදි , පාර්ලිමේන්තු මහලේකම්වරයා පාර්ලිමේන්තුවේ / කථානායකගේ පරිපාලන හස්තය බව ද පොදු එකඟතාවයක් ඇති විය.

3. තවද, අභියාචකයා විසින් ඉල්ලා ඇත්තේ 2010 සිට මේ දක්වා / 2018 දක්වා වත්කම් හා බැරකම් ප්‍රකාශනයන් ඉදිරිපත් කර ඇති <u>පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ නම් ලැයිස්තුවක්</u> බවට එකඟතාවයක් ඇති විය.

විසඳිය යුතු කරුණු සහ තීන්දු වල සාරාංශය

4. **තොරතුරු දැන ගැනීමේ පනතේ 3 (1) වගන්තියෙ අදාළත්වය.**

i. තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 3 (1) වගන්තිය ප්‍රකාරව, ඉල්ලා ඇති තොරතුරු පොදු අධිකාරිය 'සන්තකයේ', 'භාරයේ' හෝ 'පාලනයේ' පවතී නම් පොදු අධිකාරිය විසින් එම තොරතුරු 5 (1) වගන්තියේ විස්තර කර ඇති ව්‍යතිරේකයන්ට යටත්ව නිකුත් කළ යුතුව ඇත.

ii. මෙම අභියාචනයේ විසඳා ගැනීමට නියමිත ගැටලුව වන්නේ, තොරතුරු දැන ගැනීමේ පනතේ 23 වන වගන්තිය ප්‍රකාරව, පාර්ලිමේන්තුව විසින් නම් කල නිලධාරියා (DO) සහ තොරතුරු නිලධාරියා (IO) පත් කිරීම සුදුසු බවට හඳුනාගෙන ඇති පාර්ලිමේන්තු මහලේකම් කාර්යාලය හට එකී තොරතුරු ඉල්ලීමෙහි දක්වා ඇති නිශ්චිත වර්ෂයක් / වර්ෂ සඳහා වත්කම් හා බැරකම් ප්‍රකාශන ලබා දී තිබෙන පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ නාම ලේඛනය වෙත ආයතනික වශයෙන් සන්තකය', 'භාරය' හෝ 'පාලනය'ක් තිබේද යන්නට පමණක් සීමා වේ

iii. අප තීරණය කර සිටින්නේ 3(1) වගන්තිය 'ආයතනික අධිකාරිය' (institutional entity) වන ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවට අදාළ වන බවත්, ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව පොදු අධිකාරිය වන බවත්, තොරතුරු 'සන්තකයේ, භාරයේ හෝ පාලනයේ තිබේද' යන ප්‍රශ්නය පැන නගින්නේ එම පොදු අධිකාරී ආයතනය වෙත මිසක ඒ තුළ පවතින විවිධ කාර්යාල හෝ තනතුරුවලට නොවන බවත් ය. 3 (1) වගන්තිය ප්‍රකාරව පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ වත්කම් හා බැරකම් ප්‍රකාශනයන්, මෙම පනත යටතේ සියලු අභිප්‍රායන් සහ අරමුණු උදෙසා, පොදු අධිකාරිය වශයෙන් සැලකෙන පාර්ලිමේන්තුවේ ආයතනික 'සන්තකයේ, භාරයේ හෝ පාලනයේ' ඇති බවට ද අවිවාදාත්මකව තීරණය කර සිටිනු ලැබේ.

iv. "දිවිනැගුම" කෙටුම්පත ("දිවිනැගුම" පනත් කෙටුම්පත පිළිබඳ නඩු විභාගය SC.SD 01/2012 - 03/2012) සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණය ලබාදුන් තීරණය හා එහි හේතුකාරණා මත අපගේ මතය සුරක්ෂිත වේ. මෙහිදී අධිකරණය විසින්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 121 (1) ව්‍යවස්ථාවේ දක්වා ඇති පරිදි පෙත්සමේ පිටපතක් කථානායකවරයාට භාර දිය යුතුව ඇත යන්නට අනුකූලව කටයුතු නොකිරීම හේතුවෙන්, පනත් කෙටුම්පත අභියෝගයට ලක් කර පෙත්සම් වන SC.SD 02/2012 සහ SC.SD 03/2012 මුල් අවස්ථාවේදීම නිශ්ප්‍රභා කළ යුතු බවට ගත් මූලික විරෝධතාවය ප්‍රතික්ෂේප කරන ලදී. මෙම විරෝධතාවය පදනම් වූයේ එවැනි භාරදීමක් කථානායකවරයා වෙනුවට පාර්ලිමේන්තු මහලේකම්වරයා වෙත කර තිබීමය. ශ්‍රේෂ්ඨාධිකරණය තීන්දු කර සිටියේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 121 (1) ව්‍යවස්ථාවෙන් ගම්‍ය වන අරමුණු කෙරෙහි අනුකූල වීම සඳහා කථානායකවරයා වෙනුවට මහලේකම්වරයාට භාරදීම ප්‍රමාණවත් බවය

v. මේ අනුව, අපගේ නිගමනය වන්නේ ඉල්ලා ඇති තොරතුරු සැපයීම සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවේ මහලේකම් (DO) කථානායකවරයාගේ උපදෙස් ලබා ගැනීමට අවශ්‍ය නොවන බවත්, තොරතුරු නිලධාරියා (IO)/නම් කල නිලධාරියා (DO) හට ක්‍රියාත්මක කළ හැක්කේ කථානායකවරයා විසින් දෙන ලද නියෝගයක් මත පමණක් බවට ඔවුන් ගෙන ආ තර්කණය මෙම කාරණය සම්බන්ධයෙන් අදාලත්වයක් නැති බවය.

vi. තවද, වගඋත්තරකාර නම් කල නිලධාරියා (DO) සහ තොරතුරු නිලධාරියා (IO) මෙම කොමිෂන් සභාව ඉදිරියේ තර්ක කර සිටියේ ප්‍රකාශනවල සන්තකය පවත්නා ස්ථානය පිළිබඳ මහලේකම් කාර්යාලය 'දැනුවත්' වුවද, වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීමේ නීතිය, 1975 යටතේ අදාල ප්‍රකාශන පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් විසින් කථානායකවරයාට යොමු කරන බැවින් එහි

'පාලනයක්' මහලේකම් කාර්යාලය සතුව නොමැති බවයි. කොමිෂන් සභාවේ මතය වන්නේ 'දැනුවත්භාවය' යන්නෙන් එම තොරතුරු 'ආයතනික සන්තකයේ' සහ / හෝ 'ආයතනික භාරයේ' සහ / හෝ 'ආයතනික පාලනයේ' ඇති බවට විදහා පෑමක් වන බවයි. කිනම් අවස්ථාවකදී වුවද, ඉහත සඳහන් පරිදි, පාර්ලිමේන්තුවේ මහලේකම් කාර්යාලය විසින් එය පාර්ලිමේන්තුවේ පරිපාලනික හස්තය බව පිළිගෙන ඇති අතර, ඒ අනුව, අදාළ වර්ෂ සඳහා වත්කම් හා බැරකම් ප්‍රකාශන ගොනු කර ඇති පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ නාම ලේඛනය, ( එනම් අභියාචකයා විසින් ඉල්ලා ඇති තොරතුරු) එහි 'ආයතනික' සන්තකයේ, භාරයේ සහ පාලනයේ පවතින බවට සහතික වේ.

vii. මෙම කොමිෂන් සභාව අවධාරණය කරනුයේ, තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 23 වන වගන්තිය ප්‍රකාරව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 14 අ ව්‍යවස්ථාව මගින් ද (19 වන ව්‍යවස්ථා සංශෝධනය මගින් ගෙන එන ලද සහ 20 වන ව්‍යවස්ථා සංශෝධනයේ රඳවා තබා ඇති) දැක්වෙන පරිදි පොදු අධිකාරියේ මූලික ව්‍යවස්ථාපිත යුතුකමක් වන්නේ, පොදු අධිකාරියේ පරිපාලනමය විධිවිධාන තොරතුරු දැන ගැනීමේ පනතට අනුකූලව සිදු කිරීම වේ. එම ව්‍යවස්ථාපිත යුතුකම සපුරාලීමේදී පැහැදිලි පරිපාලන විෂමතාවයක් සිදුවී ඇති බව පෙන්වා දීමට අපට සිදු වී ඇත.

viii. වර්තමානයේදී, පොදු අධිකාරිය (ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව) විසින් තොරතුරු නිලධාරි/ නම් කල නිලධාරයා ලෙස පාර්ලිමේන්තු මහලේකම් කාර්යාලයේ නිලධාරීන් සහ/හෝ පාර්ලිමේන්තු මහලේකම් නම් කර ඇතිමුත්, නීතිමය වශයෙන් පාර්ලිමේන්තු කථානායකවරයාට ලබා දී තිබෙන තොරතුරු තම 'සන්තකයේ', 'භාරයේ' හෝ 'පාලනයේ' නොමැති බවට එම තොරතුරු නිලධාරියා/ නම් කල නිලධාරියා තර්ක කර සිටිනු ලැබේ. මෙම අභියාචනය යටතේ උද්ගත වූ කාරණා වල විස්තර කර ඇති මෙම පරිපාලන විෂමතාවය නිවැරදි කිරීම සඳහා කොමිෂන් සභාව බොහෝ උත්සාහයන් දැරූ නමුත් එය එතරම් සාර්ථක වී නොමැත.

ix. එහි ප්‍රතිඵලයක් ලෙස, මෙහිදී  අභියාචක වෙත පාර්ලිමේන්තුවේ තොරතුරු නිලධාරියා  / නම් කල නිලධාරියා  (පාර්ලිමේන්තු මහලේකම්) හෝ ගරු කථානායකවරයා සමඟ පිළියමක් නොමැති වීමේ තත්වයක් හට ගනී. කථානායකවරයා වෙත සමාන ඉල්ලීමක් අභියාචක විසින් යොමු කල නමුත් කථානායකවරයා පාර්ලිමේන්තුවේ තොරතුරු නිලධාරියා/ නම් කල නිලධාරියා නොවන බව පදනම් කරගෙන එයට ප්‍රතිචාරයක් දක්වා නොමැති බව මෙම කොමිෂන් සභාව ඉදිරියේ අභියාචකයා පවසා සිටියේ ය .

x. වත්කම් හා බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කල පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ වාර්තා හෝ ලේඛන පවත්වා ගැනීමට කිසිදු ලිඛිත නීතියක් යටතේ තමා බැඳී නොමැති බවට තොරතුරු නිලධාරියා (IO) / නම් කල නිලධාරියා (DO) විසින් ප්‍රකාශ කල නමුත්, තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභා රීතීන්හි (ගාස්තු හා අභියාචන කාර්යය පටිපාටිය) 4(7) වන රෙගුලාසිය (2017.02.03 දිනැති අංක 2004/66 අති විශේෂ ගැසට් පත්‍රය) මගින් එය ප්‍රතික්ෂේප කරනු ලැබේ. තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 3(1) වගන්තිය ප්‍රකාරව පොදු අධිකාරිය 'සන්තකයේ', 'භාරයේ' හෝ 'පාලනයේ' යන අංග තුනෙන් එකක් තුළ ඇති තොරතුරු 'සාධාරණ උත්සාහයක්' දරා ලබා දිය හැකි නම් පොදු අධිකාරියක් විසින් එකී ඉල්ලා ඇති තොරතුරු ලබා දීමට අවශ්‍ය වන බව මෙම රෙගුලාසියෙන් දක්වා සිටින අතර, මෙම අභියාචනයේ තත්වයන් තුළින් මෙකී රෙගුලාසිය තෘප්ත වී ඇති බවට අපගේ මතය වේ.

**පොදු අධිකාරිය දැක්වූ විරෝධතා.**

5. පොදු අධිකාරිය විසින් මතු කරන ලද විරෝධතා පිළිබඳ සලකා බැලීමේදී, අප විසින් ට්‍රාන්ස්පේරන්සි ඉන්ටර්නැෂනල් ශ්‍රී ලංකා එ. ජනාධිපති ලේකම් කාර්යාලය ( RTIC Appeal 06/2017- 2018.12.04 දිනැති නියෝගය) හි එළඹ ඇති ස්ථාවරය නැවතත් අවධාරණය කර සිටිනු ලැබේ. එනම්, තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 4 වන වගන්තිය ප්‍රකාරව වත්කම් සහ බැරකම් ප්‍රකාශ කිරීමේ නීතිය අභිබවා තොරතුරු පනත බලාත්මක වන බවත් මෙම අවස්ථාවේදී “*generalia specialibus non derogant” ආප්තය අදාල නොවන බවත් ය.*

6. ඉල්ලා ඇති තොරතුරුවල රහස්‍යභාවය සම්බන්ධයෙන් පොදු අධිකාරයේ නම් කල නිලධරයා විසින් දැඩි ලෙස තර්ක කර සිටී. අපගේ මතය නම්, එම තර්කය පිළිගත නොහැකි බවයි. මන්දයත්, තොරතුරු ඉල්ලා ඇත්තේ වත්කම් සහ බැරකම් ප්‍රකාශන නිසි නෛතික ප්‍රතිපාදන යටතේ ගොනුකර ඇති පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ නම් ලැයිස්තුවක් සම්බන්ධයෙන් වන බැවිනි. එලෙස ප්‍රකාශනයක් ලබාදීම මන්ත්‍රීවරුන්ගේ ව්‍යවස්ථාපිත යුතුකමක් ද වේ. තව ද, අප විසින් *ට්‍රාන්ස්පේරන්සි ඉන්ටර්නැෂනල් ශ්‍රී ලංකා එ. ජනාධිපති ලේකම් කාර්යාලය* ( RTIC Appeal 06/2017- 2018.12.04 දිනැති නියෝගය) හි එළඹ ඇති නිගමනය පරිදි මහජන නියෝජිතයෙකුගේ (අගමැතිගේ) වත්කම් සහ බැරකම් ප්‍රකාශනය සම්බන්ධයෙන් තොරතුරු තොරතුරු පනතේ 6 වගන්තිය ප්‍රකාරව එකී තේරී පත්වූ නියෝජිතයාට අදාල වෙනත් පුද්ගලයෙකුගේ පුද්ගලික තොරතුරු ඉවත් කොට ලබා දීම මගින් තොරතුරු දැනගැනීමේ පනතේ 5(1)(අ) වගන්තිය ප්‍රකාරව පුද්ගලිකත්වය/රහස්‍යභාවය සම්බන්ධ ප්‍රශ්නයක් ඇති නොවේ.

7. තවදුරටත් අප විසින් ප්‍රකාශ කර සිටින්නේ, 'පාර්ලිමේන්තු වරප්‍රසාද' උල්ලංඝණය කිරීමකට ලක්වන තොරතුරු සම්බන්ධයෙන් දැක්වෙන පනතේ 3(2) වගන්තිය හෝ 5(1)(ඔ) වගන්තිය වුව ද ප්‍රශ්නගත මෙම තොරතුරු ලබා දීම ප්‍රතික්ෂේප කිරීමේ ව්‍යතිරේකයක් වශයෙන් යොදා ගත නොහැකි බවය. 1975, වත්කම් සහ බැරකම් ප්‍රකාශ කිරීමේ නීතිය ප්‍රකාරව තම වත්කම් සහ බැරකම් ප්‍රකාශ කථානායකවරයා වෙත භාරදුන් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ <u>නම් ලැයිස්තුවක්</u> නිකුත් කිරීම සම්බන්ධයෙන් පාර්ලිමේන්තු වරප්‍රසාද පදනම කවර ආකාරයෙන් හෝ අදාළ නොවන බව මුල් අවස්ථාවේදීම පෙනී යනු ලැබේ.

8. තවද, තෙරී පත්වූ මහජන නියෝජිතයන්ගේ වගවීම සහ විනිවිදභාවය සම්බන්ධයෙන් පවතින අවශ්‍යතාවය මත ඉල්ලා ඇති තොරතුරු මහජනයාට ඉතා ඉහළ වැදගත්කමකින් යුතු තොරතුරු බව පැහැදිලි වේ. පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් විසින් කථානායකවරයා වෙත සිය වත්කම් සහ බැරකම් ප්‍රකාශයන් ඉදිරිපත් කිරීම 1975 වත්කම් සහ බැරකම් ප්‍රකාශ කිරීමේ නීතිය ප්‍රකාරව ඇති නෛතික යුතුකමකි. මේ අනුව ඉල්ලා ඇති තොරතුරු තේරී පත්වූ මහජන නියෝජිතයන් විසින් තම නෛතික යුතුකම ඉටුකිරීම හා සම්බන්ධ වේ. මේ දත්ත පිළිබඳව මෙතරම් ඉහළ රහස්‍යභාවයක් පවත්වාගත යුත්තේ ඇයි ද යන්න පිළිබඳව අපට සැලකියයුතු ප්‍රශ්නාර්ථයක් ඇතිව තිබේ.

9. ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව ද ඇතුලුව 'පොදු අධිකාරීවල විනිවිදභාවය සහ වගවීම පිළිබඳව වන සංස්කෘතියක් ඇති කිරීම' සඳහා තොරතුරු පනත ප්‍රකාරව ස්ථාපිත කර ඇති මෙම කොමිෂන් සභාව, මේ සම්බන්ධයෙන් වූ තම පොදු වගකීම පිළිබඳව දැනුවත්ව සිටී. අභියාචක විසින් ඉල්ලා ඇති තොරතුරු එනම් සිය නෛතික යුතුකම ඉටුකරන ලද මන්ත්‍රීවරුන්ගේ නම් ලැයිස්තුවක් 1975 වත්කම් සහ බැරකම් ප්‍රකාශ කිරීමේ නීතිය යටතේ කැඳවීමට හා ලබා ගැනීමට නොහැකි බැවින්, මෙම තොරතුරු ඉල්ලීම සම්බන්ධයෙන් කොමිෂන් සභාව වෙත ඉහත කී වගකීම අවශ්‍යයෙන්ම ඇති වේ.

10. තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 4 වන වගන්තිය ප්‍රකාරව තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත 1975 වත්කම් සහ බැරකම් ප්‍රකාශ කිරීමේ නීතිය අභිබවා යන බවට වූ කොමිෂන් සභාව ඉහතින් ප්‍රකාශ කරන ලද ස්ථාවරයට අගතියකින් තොරව, අපගේ මතය නම්, යම් හෙයකින් පොදු අධිකාරිය ගෙන හැර පාන ලද තර්කය පිළිගන්නේ නම්, එනම් 1975 වත්කම් සහ බැරකම් ප්‍රකාශ කිරීමේ නීතියෙන් මෙවැනි තොරතුරු ඉල්ලීම හෝ තොරතුරු ලබාදීම සම්බන්ධයෙන් ඉඩ නොදෙන නමුත්, තොරතුරු දැනගැනීමේ පනතේ ප්‍රතිපාදනයන්ට අනුව නොව එකී නීතියේ ප්‍රතිපාදනයන් යටතේ තොරතුරු ලබා ගැනීමට ඉල්ලීමක් කරන ලෙසට සැල කිරීම එලෙසින්ම එහි මතුපිට හෝ මුහුණතේ අර්ථයෙන් ගත්කල, තොරතුරු අපේක්ෂාවෙන් තොරතුරු ඉල්ලා සිටින අභියාචකයාට කිසිදු පිළියමක් නොමැති වනු ඇති බවයි. මෙය 2006 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත මගින් ස්ථාපනය කිරීමට අපේක්ෂා කරනු ලබන තොරතුරු තන්ත්‍රය පුළුල් සේ ප්‍රතික්ෂේප කිරීමක් වේ. මේ හේතුවෙන්, තොරතුරු හෙළිදරව් කිරීමෙන් වන මහජන සුභසිද්ධිය පිළිබඳ දැක්වෙන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 5(4) වගන්තිය, පොදු අධිකාරිය මගින් ගෙනහැර දැක්වූ විරෝධතා විශේෂයෙන් පනතේ 3(2) වගන්තිය සහ 5(1)(අ), 5(1)(ඔ) වගන්තියන්හි ප්‍රතිපාදන අභිබවා යන බව කොමිෂන් සභාව නිර්දේශ කරනු ලබයි.

මේ අනුව, මෙම අභියාචනයේ නම් කල නිලධාරියාගේ තීරණය ප්‍රතිවර්තනය කරනු ලබන අතර අභියාචක විසින් ඉල්ලා ඇති තොරතුරු ලබා දීමට නියම කරනු ලැබේ.

තවදුරටත් ප්‍රකාශ කරනුයේ, සැලකිය යුතු කාලයක් මෙම නියෝගය ලබා දීම සඳහා ගත වූයේ, එවකට අග්‍රාමාත්‍යවරයාගේ වත්කම් සහ බැරකම් ප්‍රකාශ හෙළිදරව් කරන ලෙසට කොමිෂන් සභාව විසින් මීට පෙර ලබාදෙන ලද නියෝගයක් සම්බන්ධයෙන් ජනාධිපති ලේකම් කාර්යාලයෙන් කල අභියාචනා පෙත්සමක් (CA/RTI/01/2019) ගරු අභියාචනාධිකරණය හමුවේ විභාග වී අවසන් වන තෙක් කල් තැබීමට මෙම අභියාචනයේ දෙපාර්ශවයන්ගේ එකගතාවය මතය. කෙසේ වෙතත්, අභියාචක විසින් මෙම කොමිසම හමුවේ අභියාචනයක් ගොනුකොට වසර දෙකක් සහ මාස තුනකට ආසන්න කාලයක් පසු වී ඇති බැවින් මෙම නියෝගය මෙසේ ලබා දෙනු ලැබේ.

මෙම අභියාචනය මෙයින් අවසන් කරනු ලැබේ.

කොමිෂන් සභා රීතින්හි, රීති අංක 27 (ගාස්තු හා අභියාචනා කාර්යපටිපාටිය, ගැසට් අංක 2004/66, 2017.02.03) ප්‍රකාරව මෙම නියෝගය දෙපාර්ශවය වෙත සන්නිවේදනය කරනු ලැබේ